## කෙටි කතාව



# මිනිසකු පිට නැගි අසරුවෙකි



**අසේල දේවේන්ද්‍ර**

**යා**න්තම් ඇති.....ගුණදාස ගෝරනාඩුව ඉවර කරලා ගෙදර ගියා. පැයක් පරක්කු වුණාට ඔය තරම් කෑ ගහන්න ඕනෙද? මිනිහට තේරෙන්නෙ නැද්ද උදෙන්ම බස් වල සෙනග ----------අමාරුයි කියලා. හය හමාරවත් වෙනවා සෙනග ටිකක් පිරෙන්න. මේ වෙලාවටත් එන්නෙ කොච්චර අමාරුවෙන්ද? එයා කියන විදිහට ටිකට් අරන් එන්න ගියොත් පඩියම ඉවරයි මගටම. මිනිහ හරියට මුළු රෑම නැගිට ගෙන මුර කරනව වගේ කතාව. ලොරියක් ඇතුළට රිංග ගෙන නිදා ගන්න එකනෙ කරන්නේ. වැඩකට කරන්නෙ වාහන වල ඩීසල් ටැංකියට බටයක් දාලා ඩීසල් උරන එකනෙ. ඩීසල් වල විසටම ඉස්සරහා දත් ඔක්කොම වැටිලා.

සිරිසෝම වෙනදා වගේම අදත් උදෙන්ම ඇවිත්. මිනිහව තියලා ගිහින් තේ එකක් බීලා එන්න ඕනෙ. ඒ එක්කම ඊයෙ දැම්ම විට් එක වැඩ කරලද කියලා බලා ගන්න පුළුවන්.

-සිරිසෝම අයියේ, පොඩ්ඩක් බලා ගන්නවද, කඩේට ගිහින් එනකං".

අළුත් මුදලාලි හොඳ මනුස්සයා. කිසිම ලෝබකමක් නැතිව ණයට දෙනවා. ඉස්සර මුදලාලි නම් රුපියල් දෙසීය පනින කොට කරදර කරනවා. එයාගෙ පවුල් ප්‍රශ්න නිසා කඩේ දාලා ගමට ගිය එක හොඳට ගියා.

අන්තිම දවස් දෙකේ නිවාඩු දැම්ම නිසා බේරුණා. නැත්නම් මම කොහෙන් රුපියල් හාරසීයක් හොයන්නද? නිවාඩු නැති නිසා නෝ-පේ ගියා. එතනත් මටයි පාඩු උනේ.

-මුදලාලි මල්ලී, ඉදිආප්ප ගොඩවල් දෙකක් දෙනවද, මාළුත් එක්ක".

ඊයෙ රෑට කෑවේ පාන් කෑල්ලක් විතරයි. හොඳටම බඩගිනියි. කරුමෙට අදත් විට් එක වැඩ කරලා නෑ. හැබැයි අද නම් හොඳටම ෂුවර් අස්සයෝ ටිකක් දුවනවා. දවල් වෙන කොට කීයක් හරි හොයා ගන්න ඕනෙ. ඕවර් - ටයිම් ගෙවන දවස නිසා පිට වැඩ කරන අය එයිනේ. වැඩ පොළේ අය නම් මට සතයක්වත් දෙන්නෙ නෑනෙ. හරියට මැරුණම ගෙනියන්න වගේ පරණ ණය ඉල්ලනවා. විට් එකක් වැඩ කරාම ඔය ඔක්කොටම ණය පොළිත් එක්ක බේරනවා.

-ආ පෙරේරා අයියේ, කාලෙකින්, මොකද ගල්රෝලේ රෙපයාර් එකක්ද? අද නම් මම හිතන්නෙ නෑ පුළුවන් වෙයි කියලා. කට්ටි දෙකක්ම පිට ගිහිල්ලා".

මිනිහා ලඟුව කෑවා වගෙයි. ගාණක් කඩා ගන්න පුළුවන් වෙයි.

-අපොයි ලොකු මහත්තයට කතා කරන්න නම් යන්න එපා පෙරේරා අයියේ. උදේ ඉඳන්ම හැමෝටම කෑ ගහනවා. දැන් ගියොත් පෙරේරා අයියවත් එලව ගනියි".

මෙයා ගිහින් ලොකු මහත්තයට කතා කළොත් මගෙ වැඩේ වෙන්නෙ නෑනෙ.

-පෙරේරා අයිය ගිහින් තේ එකක් බීලා එන්නකෝ. එනකොට මට කිඹුලා බනිස් එකක් අරන් එනවද? කිරි තේ එක මේ බෝතලේට දාගෙන එන්න".

මෙයාලගෙන් කීයක් හරි ගත්තට කමක් නෑ. ඩීසල් විකුණලයි, අත්තිවාරම් තලලයි කොච්චර හම්බ කරනවද?

දවල්ට කෑම පැකට් කීපයක් විකුණ ගත්තොත් ගාණක් හොයා ගන්න පුළුවන්. කොහෙද ආතර් මල්ලියි තව කීප දෙනෙකුයි කෙළින්ම බයිසිකල් කාරයගෙන් සල්ලි දීලා ගන්නවනේ. ආත වෙන්න ඕන මහත්තයට කේළම කියන්න ඇත්තේ. මම බයිසිකල් කාරයගෙන් ණයට කෑම පැකට් අරන් වැඩපොළේ අයට සල්ලි වලට විකුණනවා කියලා. මම දෙපැත්තටම උදව්වක්නෙ කරන්නෙ. බයිසිකල් කාරයගෙ කෑමත් විකිණෙනවා, වැඩපොළේ අයට රුපියල් දොළහෙ කෑම එක රුපියල් දහයටත් හම්බ වෙනවා. මම කොයිතරම් හොඳ වැඩක්ද කරන්නෙ. විට් එකක් වැඩ කරපු ගමන් මිනිහගෙ ණයත් මම ගෙවනවා. කරුමෙට කාලෙකින් හරි අස්සයෙක් වැඩ කරේ නෑනේ.

හෙටම බත්තරමුල්ලෙ මේරි අක්කගෙ ගේ කෑල්ලට ඇඩ්වාන්ස් එකක් දීලා පවුලයි, දරුවෝ දෙන්නයි එක්ක එන්න ඕනෙ. නැන්දම්මා මට ළමයි බලන්නවත් යන්න දෙන්නෙ නෑනෙ බොරුකාරයා, රේස්කාරයා කියලා.

ෆෝමන් මහත්තයට ගිහින් කියින්න ඕනෙ ගල්රෝල් කාරයෙක් ඇවිල්ල ඉන්නව කියලා. එතකොට කට්ටියක් යවයි රෙපයාර් එකට.

-ආ පෙරේරා අයියේ, යන්තං ෆෝමන් මහත්තයට කියලා කට්ටියක් ලෑස්ති කරගත්තා. තියෙනවා නම් රුපියල් පණහක් ණයට දෙනවද".

-කමක් නෑ රුපියල් විස්සක්වත් දෙන්න. මම කතා කරේ නැත්නම් අද පෙරේරා අයියට හිස් අතින් යන්නයි වෙන්නෙ".

යාන්තම් ඇති රුපියල් අසූවක් හොයා ගත්තා. බයිසිකල් කාරය චුරු චුරු ගෑවා ණය වැඩියි කියලා. රුපියල් සීයක් විතර දෙන්න ඕනෙ ලැබුණ ගමන්ම. කොමිස් එකට ලැබුණ කෑම පැකට් එකත් දීගත්ත නිසා එතනත් රුපියල් දහයක් ලැබුණා.

දවල්ටත් කඩෙන් පොතට කෑම එකක් ගන්න පුළුවන්. දැන් බුකියට ගිහින් රුපියල් පණහක් විට් එකට දාන්න ඕනෙ. ඉතුරු රුපියල් තිහ වියදමට තියා ගන්න ඕනෙ. ඕවර්-ටයිම් එක එහෙමම යනවනෙ සමිතියෙ ණයට. ණය ගන්න ලැයිස්තුවෙ මුල් නොම්බරයක් ඇදුනු සුනිල්ට රුපියල් සීයක්ම දෙන්න උනානෙ නොම්බරේ ගන්න. ජයලත් හිටියෙ නැත්නම් සුනිල් මෝඩයව රවට්ටලා නිකන්ම ගන්න තිබුණා. මේ විට් එක වැඩ කරාම හෙට මට පුළුවන් ඔය ඔක්කොම ණය බේරන්න. එතකොට ඔය ඊරිසියාකාරයින්ගෙ කටවල් නිකන්ම වැහෙයි.

හෙටම බත්තරමුල්ලෙ මේරි අක්කගෙ ගේ කෑල්ලට ඇඩ්වාන්ස් එකක් දීලා පවුලයි, දරුවෝ දෙන්නයි එක්ක එන්න ඕනෙ. නැන්දම්මා මට ළමයි බලන්නවත් යන්න දෙන්නෙ නෑනෙ බොරුකාරයා, රේස්කාරයා කියලා. එයාටත් දෙකක් කතා කරලයි කට්ටිය එක්ක එන්න ඕනෙ. යනකොට පොඩි ඇයොන්ට ඇපල්, මුද්දරප්පලම් ටිකකුත් අරන් යන්න ඕනෙ.

මහත්තයා එන්න කලින් විට් එක දාලා ආපහු එන්න ඕනෙ. අස්සයො ටික කම් කියලා වැඩක් නෑ. ඔක්කොම වින් අස්සයෝ. හෙට උදේම හොඳ ගාණක් අතේ. ඒත් මේ ඔක්කොම කරන්න රුපියල් පණහක් දාලා මදි වෙයි නේද? රුපියල් අසූවම දැම්මොත් නම් ඇති වෙයි. ඒත් අතේ වියදමට කීයක්වත් නැති වෙනවනෙ. කමක් නෑ හැන්දෑවට කීයක්වත් හොයා ගන්න බලනවා. සල්ලි සේරම දාන්න ඕනෙ. හෙට උදේ වෙනකොට මේ දුක් කරදර ඔක්කොම ඉවරයිනේ... ■

---

10 පිටෙන්

ජනාධිපති ධූරයට පත් වූ පසු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පිරිසක් සමඟ එක් ව ජාතික ආණ්ඩුවක් සෑදීමේ සූදානමක් ඇති බවට ද දේශපාලන අංශ තුළ කතා බහක් පැතිර ගොස් ඇත්තේ මේ නිසා විය යුතු ය. පසුගිය දිනෙක ජනාධිපතිනිය හා රනිල් වික්‍රමසිංහ අතර, විශේෂ සාකච්ඡාවක් ද පැවැත්විණ. නිල වශයෙන් වාර්තා වුණේ මැතිවරණය සාමකාමීව පැවැත්වීම හා රටේ තත්වය සම්බන්ධයෙන් එම සාකච්ඡාව පැවැති බව ය.

එසේ වුව ද, එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ ආරංචි මාර්ග සඳහන් කරන්නේ වෙනත් කතාවකි. එක්සත් ජාතික පක්ෂයේ ආසන්නතම උත්සාහය වී ඇත්තේ ජනාධිපතිනිය ලවා අයවැය ඉදිරිපත් කිරීම වලක්වා ගැනීමයි. රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිනිය හමුවුණේ ද ඒ සඳහා බව ද රාවයක් ඇත. කෙසේ වෙතත්, අයවැය නියමිත පරිදි ඉදිරිපත් කරන බව ආණ්ඩුව සහතික වී තිබේ. එසේ වුව ද මුදල් අමාත්‍ය සරත් අමුණුගම ද එක්සත් ජාතික පක්ෂයට යන්නට සූදානමින් සිටින බවට පැතිර යන රාවය නිසා, බොහෝ දෙනකු අපේක්ෂා කරන්නේ අයවැය ඉදිරිපත් නොකෙරෙනු ඇතැයි යන පුවත ය.

මැතිවරණයක් ආසන්නයේ පක්ෂ මාරු කිරීම සාමාන්‍ය දෙයකි. ඒ අනුව මෙවර ද එවැනි පිල් මාරුවීම් සිදු වෙමින් පවතී. කෙසේ වෙතත් බිම් මට්ටමේ හැර ශ්‍රීලනිප හෝ ඊට සම්බන්ධ වෙනත් කිසි ම පක්ෂ ඉහල පෙලේ සාමාජිකයකු එජාපයට එක් වී නැත. එක්සත් ජනතා නිදහස් සන්ධානයට දිනපතා ම පාහේ එජාප සාමාජිකයන් එක්වෙමින් සිටී. එසේ වුවත් විශාල වශයෙන් එජාප ඡන්ද පදනමට බලපෑමක් කළ හැකි කිසිවකු පැමිණ නැත. බොහෝ විට එලෙස එක්වන්නේ විශ්‍රාම ගිය එජාප ප්‍රාදේශීය දේශපාලනඥයන් ය. කෙසේ වෙතත් ලංකා කම්කරු කොංග්‍රසයේ හා කඳුරට ජනතා පෙරමුණේ නිල තල දැරූ මෙන් ම පළාත් සභා මන්ත්‍රීවරු කිහිප දෙනකු මේ වන විට මහින්ද රාජපක්ෂ මහතාට සහාය පල කිරීමට එක් ව සිටිති.

ශ්‍රී ලංකාවේ සෑම මැතිවරණයක දී ම තීරණාත්මක සාධකයක් වන්නේ එල්ටීටීඊ සංවිධානයයි. එල්ටීටීඊ සංවිධානයේ වැඩි කැමැත්ත ඇත්තේ රනිල් වික්‍රමසිංහ මහතාට ය යන්න පොදුවේ පවතින මතයකි. කෙසේ වෙතත් මෙවර ඔවුන් සෘජුව රනිල් වික්‍රමසිංහ මහතා වෙනුවෙන් පෙනී සිටින බවක් දැක ගන්නට නැත. ඔවුන් පවසන්නේ කවරෙකු ජනාධිපති වුව ද තමන්ට එය ප්‍රශ්නයක් නොවන බව ය. එසේ ම මහින්ද රාජපක්ෂ රටේ සිංහල බෞද්ධ ඡන්ද දිනාගෙන ජනාධිපති වන්නට සැරසෙද්දී රනිල් වික්‍රමසිංහ සුළු ජාතික ඡන්ද පිහිටෙන් ජනාධිපතිවන්නට සූදානම් වීම ඔවුන්ගේ නොසතුටට හේතු වී ඇත. ඔවුන් මෙම ස්ථාවරයට පැමිණ සිටින්නේ මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කිරීම තුළින් ඔවුන්ට තම අරමුණ කරා යන ගමන යළි, අලුතෙන් ආරම්භ කරන්නට අවස්ථාව ඇති නිසා බව ඇතැම් දේශපාලන නිරීක්ෂකයෝ පෙන්වා දෙති. එල්ටීටීඊ සංවිධානය නිහඬ ව සිටින බව පවසන නමුත් ඔවුන්ගේ පාලනය යටතේ පවතින උතුරේ කිලිනොච්චිය හා මුලතිව් වැනි දිස්ත්‍රික්කවල රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රචාරක කටයුතු ඉතා ප්‍රබලව, සිදු කෙරෙන බව දැන ගන්නට ඇත. උතුරේ තත්වය එසේ වුව ද නැඟෙනහිර වැඩි වාසිය ඇත්තේ මහින්ද රාජපක්ෂට බව පෙනෙන්නට තිබේ. ඊට හේතු වී ඇත්තේ කරුණා සාධකය හා මුස්ලිම් ජනතාව රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රතික්ෂේප කිරීම ය.

දැනට පවතින අලුත් ම තත්වය වන්නේ මහින්ද රාජපක්ෂ මහතාත් රනිල් වික්‍රමසිංහ මහතාත් මීළඟ ජනාධිපතිවරයා වීම සඳහා කරටකර සටනක නිරතව සිටීම ය. මෙම සටනෙන් ජය ගන්නේ කවුරුන් ද යන්න හරිහැටි පැහැදිළි කිරීමට තරම් පසුබිමක් නැත. විටෙක මහින්දට දෝලනය වන ජය තවත් විටෙක රනිල් වෙත ඇදෙන බව පෙනේ. තවත් විටෙක එය රනිල්ගෙන් ගිලිහී මහින්ද වෙත දෝලනය වන බව පෙනේ. මේ තියුණු තීරණාත්මක සටනේ ජයග්‍රාහකයා වන්නේ කවුරුන් දැයි උපකල්පනය කිරීම පවා අපහසු වී ඇත්තේ මේ පසුබිම නිසා ය. ■